මෙම පිටුවෙහි ඇති තොතුරු

- ගමන් කිරීම සම්බන්ධ සීමා
    - ඕස්ට්‍රේලියානු ගමන් සීමාවලින් බැහැර කිරීමක් ඉල්ලා සිටීම සම්බන්ධ යාවත්කාලීන
    - බැහැර කල කාණ්ඩ
    - තනි පුද්ගලයන් හට ලබාදෙන බැහැරකිරීම්
    - ගමන් කිරීම සඳහාවූ සානුකම්පිත සහ පාලනයෙන් තොර හේතු
    - බැහැර කිරීමක් සඳහා මාර්ගගතව අයදුම් කරන්න

# ගමන් කිරීම සම්බන්ධ සීමා

ඕස්ට්‍රේලියානු ප්‍රජාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව සතුව දැඩි දේශ සීමා ක්‍රියාමාර්ග ඇත. ඕස්ට්‍රේලියාවේ සිට සහ ඕස්ට්‍රේලියාව වෙත ඉතාම සීමිත ගුවන් ගමන් පමණක් දැනට ඇති අතර, මෙම අවස්ථාවේදී ඔබට ගමන් කිරීම කල නොහැකි විය හැකිය. ගමන් කිරීම සම්බන්ධ සීමා වෙනස් කිරීම්වලට යටත්වේ. නිතිපතා පරීක්ෂාකර බලන්න. බලන්න: ජාතික කැබිනට් මණ්ඩල මාධ්‍ය ප්‍රකාශන.

ඕස්ට්‍රේලියානු පුරවැසියන් ඇතුළු, ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන සියළුම මගීන්, තමා පැමිණෙන තොටුපළේ ඇති හෝටලයක් වැනි නියම කරන ලද පහසුකමක දින 14 ක් නිරෝධායනය විය යුතුය. ගමන් කරන අය සඳහාවූ කොරෝනා වයිරස් (කෝවිඩ්-19) උපදෙස් බලන්න. ඔබගේ නිරෝධායනය සඳහා යන වියදම ඔබ විසින් දැරීමට සිදුවිය හැකිය. නිරෝධායන අවශ්‍යතාවයන් සම්බන්ධ වැඩිදුර විස්තර සොයා ගැනීම සඳහා අදාල ප්‍රාන්ත සහ ටෙරිටරි රජයේ සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවන්න.

ඔබ බැහැරකල කාණ්ඩයකට අයත්වේ නම් හෝ දැනට ඇති ගමන් සීමා සම්බන්ධ බැහැර කිරීමක් ඔබට ප්‍රදානය කර ඇතිනම් මිස, ඔබට ඕස්ට්‍රේලියාව වෙත පැමිණිය නොහැක.

## ඕස්ට්‍රේලියානු ගමන් සීමාවලින් බැහැර කිරීමක් ඉල්ලා සිටීම සම්බන්ධ යාවත්කාලීන

අළුතින් සකස් කල සේවා සැපයීමේ වේදිකාවක් මගින් ඔබගේ ගමන් සීමා බැහැර කිරීම සම්බන්ධ ඉල්ලීම් පහසුවෙන් යොමුකල හැකි අතර එහි ප්‍රගතිය සොයා බැලිය හැකිය.  නව ගමන් සීමා බැහැර කිරීමේ පෝර්ටලය මගින් ප්‍රතිලාභ බොහෝමයක් ලබාදෙන අතර ඒවා අතර පහත දේ ඇත:

- භාවිතයට පහසු ක්‍රියාකාරීත්වය
- ඔබගේ ඉල්ලීම ලද බව ක්ෂණිකව දැනුම්දීම
- සහායක ලියකියවිලි පහසුවෙන් ඇමිණීම සහ යාවත්කාලීන කිරීම
- කණ්ඩායම් සහ පවුලේ අයගේ ඉල්ලීම් සම්බන්ධකල හැකිය
- ඔබගේ ඉල්ලීමේ ප්‍රගතිය සොයා බැලිය හැකිය
- තීරණයක් ගත් විගස ඒ බව දැනුම්දීම.

ඔබගේ අයදුම් පත්‍රය 2020 ජුලි 17 වන සිකුරාදා නව පෝර්ටලය ආරම්භවීට පෙර යොමුකලේ නම්, 2020 ජුලි 31 වන සිකුරාදා දින ඕස්ට්‍රේලියානු නැගෙනහිර සම්මත වේලාවෙන් ප.ව. 5 වනවිට අප විසින් සලකා බලා අවසානයට පත් කරනු ඇත. ඔබගේ ඉල්ලීම 2020 ජුලි 17 වන දිනට පෙර යොමුකලේ නම්, සහ මෙතෙක් අප ඔබ සමඟ සම්බන්ධ නොවිණි නම්, කරුණාකර නව ඉල්ලීමක් යොමු කරන්න, අප ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් ඔබ සමඟ සම්බන්ධවනු ඇත.

ගමන් සීමා සම්බන්ධ බැහැර කිරීමකට අයදුම් කරන්න

## බැහැර කල කාණ්ඩ

ඔබ පහත කාණ්ඩයකට අයත්වේ නම්, ඔබ ස්වයංක්‍රීයවම ගමන් සීමාවලින් බැහැරවන අතර ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණිය හැකිය (තනි පුද්ගලයෙකු සම්බන්ධ බැහැර කිරීමක් ලබා නොගෙන):

- ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු
- ඕස්ට්‍රේලියාවේ නිත්‍ය නේවාසිකයෙකු
- ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ ඕස්ට්‍රේලියානු නිත්‍ය නේවාසිකයෙකුගේ සමීප ඥාතියෙකු
- ඕස්ට්‍රේලියාවේ සාමාන්‍ය වශයෙන් පදිංචිව සිටින නවසීලන්ත පුරවැසියෙකු සහ ඔවුන්ගේ සමීප ඥාතීන්
- ඕස්ට්‍රේලියාවට එවන ලද තානාපතිවරයෙකු (වීසා උපකාණ්ඩ 995 වීසා බලපත්‍රලාභියෙකු)
- ඕස්ට්‍රේලියාව ඔස්සේ පැය 72 ක් හෝ ඊට අඩු කාලයක් ගමන් කරන අයෙකු
- ගුවන් ගමන් කාර්ය මණ්ඩල
- නෞකා නියමුවන් ඇතුළු සමුද්‍රීය කාර්ය මණ්ඩල.
- රජය මගින් අනුමත කල කාලීන සේවක වැඩසටහන හෝ පැසිපික් ශ්‍රම වැඩසටහන යටතේ සේවයට බඳවා ගත් අය.

ඔබ ගමන් කරන විට ඉහත කාණ්ඩවලින් එකකට අයත් බව දැක්වීමට අවශ්‍ය සාක්ෂි රැගෙන යා යුතුය. අමතර සාක්ෂි ඉල්ලා සිටිය හැකිය.

## තනි පුද්ගලයන් හට ලබාදෙන බැහැරකිරීම්

ඔබ පහත කාණ්ඩයකට අයත්වේ නම්, ඕස්ට්‍රේලියානු දේශසීමා බලකා කොමසාරිස්වරයා විසින්, ඔබට තනි පුද්ගලයන් හට ලබාදෙන බැහැර කිරීමක් ප්‍රදානය කල හැකිය:

- කෝවිඩ්-19 ප්‍රතිචාර සඳහා උපකාර කිරීමට ඕස්ට්‍රේලියානු රජයේ හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයක අධිකාරියක් මගින් කරන ලද ආරාධනාවක් මත ගමන් කරන ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු නොවන අයෙකු
- ගුවන් ගිලන් රථ, වෛද්‍යමය වශයෙන් කරනු ලබන ඉවත්කර ගැනීම් සහ තීරණාත්මක වෛද්‍ය සැපයුම් ඇතුළු විශේෂඥ වෛද්‍ය සේවා සැපයීම
- තීරණාත්මක කුසලතා ඇති හෝ ඕස්ට්‍රේලියාවේ තීරණාත්මක ක්ෂේත්‍රයක කටයුතු කරන ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු නොවන අයෙකු
- ඕස්ට්‍රේලියානු රජයේ හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයක අධිකාරියක් මගින් සහාය ලබාදෙන, ජාතික අවශ්‍යතාවය මත ගමන් කරන ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු නොවන අයෙකු
- හමුදාවල තත්වයන් සම්බන්ධ ගිවිසුම, කොමන්වෙල්ත් හමුදා, ආසියා පැසිෆික් බලකා සහ හමුදා බලකා තත්ව සම්බන්ධ ගිවිසුම්වල අංගයක් වන අය ඇතුළු මිලිටරි පුද්ගලයන්
- සානුකම්පිත සහ පාලනයෙන් තොර කරුණු සඳහා ගමන් කරන අය.

ඔබ ගමන් කිරීමට පෙර වලංගු වීසා බලපත්‍රයක් සහ ඕස්ට්‍රේලියාවේ ගමන් සීමාවලින් බැහැර කිරීමක් ලබා තිබිය යුතුය. ඔබට බැහැර කිරීමක් සඳහා මාර්ගගතව ඉල්ලීමක් කල හැකි අතර ඔබගේ ඉල්ලීමට උපකාර කිරීම සඳහා නිසි සාක්ෂි ලබාදිය යුතුය. ප්‍රමාණවත් සාක්ෂි ලබා නොදුනහොත්, වැඩිදුර සලකා බැලීමකින් තොරව ඉල්ලීම සලකා බැලීම අවසාන කල හැකිය. සියළුම ලියකියවිලි නිල වශයෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කල යුතුය.

**ඔබගේ සැලසුම්කල ගමන ආරම්භයට පෙර අවම වශයෙන් සති දෙකකට පෙර හෝ මාස තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත අයදුම් කල යුතුය.**

ඔබගේ ඉල්ලීමට පහත කරුණු ඇතුලත් විය යුතුයඃ

- ගමන් කරන අයගේ තොරතුරුඃ නම, උපන් දිනය, වීසා බලපත්‍රයේ ආකාරය සහ අංකය, ගමන් බලපත්‍ර අංකය
- ඕස්ට්‍රේලියාව තුල යෝජිත නේවාසික ලිපිනය සහ දුරකථන අංකය
- ඔබ පැමිණීමට හේතුවඃ ඔබට බැහැර කිරීමක් ලබාදිය යුතු හේතුව
- සහාය ලබාදෙන ප්‍රකාශනයක්ඃ ඔබ බැහැර කිරීම සම්බන්ධ පදනමක් සපුරාලන ආකාරය
- අදාල සාක්ෂි.

ඔබට බැහැර කිරීමක් ප්‍රදානය **නොකලහොත්,** ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීමට ගුවන් යානයකට ගොඩවීමට ඉඩ ලබා නොදෙන බැවින්, ඔබගේ ගමන් සැලසුම අනුව කටයුතු නොකල යුතුය. ඔබට ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමක් ප්‍රදානය කලහොත්, එම බැහැර කිරීම සම්බන්ධ තීරණය ගුවන් තොටුපල වෙත රැගෙන ආ යුතුය.

## ගමන් කිරීම සඳහාවූ සානුකම්පිත සහ පාලනයෙන් තොර හේතු

ඔබ සානුකම්පිත හෝ පාලනයෙන් තොර හේතු සඳහා ගමන් කිරීම සඳහා බැහැර කිරීමක් ඉල්ලා සිටීනම්, ඕස්ට්‍රේලියානු දේශ සීමා බලකා කොමසාරිස්වරයා විසින් ඔබට බැහැර කිරීමක් ප්‍රදානය කල හැකිය. සානුකම්පිත සහ පාලනයෙන් තොර කරුණු අතර සමීප ඥාතියෙකුගේ මරණය හෝ දරුණු අසනීප ඇති අතර අදාල කරුණු මේවාට පමණක් සීමා නොවේ.

ඔබ ගමන් කිරීමට පෙර වලංගු වීසා බලපත්‍රයක් සහ ඕස්ට්‍රේලියාවේ ගමන් සීමාවලින් බැහැර කිරීමක් ලබා තිබිය යුතුය. ඔබට බැහැර කිරීමක් සඳහා මාර්ගගතව ඉල්ලීමක් කල හැකි අතර ඔබගේ ඉල්ලීමට උපකාර කිරීම සඳහා නිසි සාක්ෂි ලබාදිය යුතුය. ප්‍රමාණවත් සාක්ෂි ලබා නොදුනහොත්, වැඩිදුර සලකා බැලීමකින් තොරව ඉල්ලීම සලකා බැලීම අවසාන කල හැකිය. සියළුම ලියකියවිලි නිල වශයෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කල යුතුය.

**හැකි සෑම අවස්ථාවකම, ඔබගේ සැලසුම්කල ගමන ආරම්භයට පෙර අවම වශයෙන් සති දෙකකට පෙර හෝ මාස තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත අයදුම්කලයුතුය.** ඔබ ගමන් කරන්නේ සමීප ඥාතියෙකුගේ මරණය හෝ දරුණු අසනීපයක් හේතුවෙන් නම්, මෙම කාලසීමාව ඇතුලත අයදුම්කල හැකි අතර අප විසින් අදාල ඉල්ලීමට ප්‍රමුඛතාවය ලබාදේ.

ඔබට බැහැර කිරීමක් ප්‍රදානය **නොකලහොත්,** ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීමට ගුවන් යානයකට ගොඩවීමට ඉඩ ලබා නොදෙන බැවින්, ඔබගේ ගමන් සැලසුම අනුව කටයුතු නොකල යුතුය. ඔබට ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමක් ප්‍රදානය කලහොත්, එම බැහැර කිරීම සම්බන්ධ තීරණය ගුවන් තොටුපල වෙත රැගෙන ආ යුතුය.

## බැහැර කිරීමක් සඳහා මාර්ගගතව අයදුම් කරන්න

**ඔබගේ සැලසුම්කල ගමන ආරම්භයට පෙර අවම වශයෙන් සති දෙකකට පෙර හෝ මාස තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත අයදුම් කලයුතුය.**

ගමන් කිරීම සඳහාවූ බැහැර කිරීමේ ඉල්ලීමක් සම්පූර්ණ කිරීම සඳහා ඔබට වීසා බලපත්‍රයක් තිබිය යුතු අතර ඔබගේ ඉල්ලීමට සහාය ලබාදීම සඳහා තොරතුරු සහ ලියකියවිලි ලබාදිය යුතුය. ප්‍රමාණවත් සාක්ෂි ලබා නොදුනහොත්, වැඩිදුර සලකා බැලීමකින් තොරව ඉල්ලීම සලකා බැලීම අවසාන කල හැකිය. මේවා අතර පහත දේ ඇතඃ

- හඳුනා ගැනීමේ ලියකියවිලි
- ඔබට වලංගු වීසා බලපත්‍රයක් ඇති බවට සාක්ෂි
- ගමන් විස්තරය

- විවාහ, උප්පැන්න, මරණ සහතිකය/සහතික
- ඥාතිත්වය හෝ නේවාසිකත්වය පිළිබඳ ලියකියවිලි (එකට සිටින බව පෙන්වන කුලී නිවෙස් ගිවිසුමක්, හවුල් බැංකු ගිනුම් ආදී)
- වෛද්‍යවරයකුගෙන් හෝ රෝහලකින් ඔබගේ ගමන අවශ්‍යවීමට හේතුව දක්වන ලිපියක්
- ගමන අවශ්‍යවීමට හේතුව දක්වන සේවායෝජකයාගේ ලිපියක්
- ව්‍යාපාරයකින් හෝ රජයේ ආයතනයකින් ඔබගේ කුසලතා තීරණාත්මක බව දක්වන ලිපියක්
- ඔබගේ ඉල්ලීම සනාථ කරන ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක්.

අවසාන වරට යොමු කරන ලද ඉල්ලීම පමණක් සලකා බලන බැවින්, කරුණාකර ගමන් කරන තනි පුද්ගලයෙකු සඳහා ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් නොකරන්න.

ගමන් කිරීම සඳහවූ බැහැර කිරීමක් ලබා ගත් පමණින්ම මෙම අවස්ථාවේදී ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීමට ගුවන් යානයක් සොයා ගත හැකි බවට කිසිදු තහවුරුවක් ලබා නොදේ.

ගමන් සීමා සම්බන්ධ බැහැර කිරීමකට අයදුම් කරන්න